## කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව

## මාතර දිස්ත්‍රික්කය

1 මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 මැයි 28 දිනද ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 ජුනි 05 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 පෙබරවාරි 21 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව කඹුරුපිටිය ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට කඹුරුපිටිය ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ශේෂ පිරික්සුමට එකතුව රු.108,079,475 ක් වූ ආදායම්ද, එකතුව රු.104,055,568 ක් වූ වියදම් ද ඇතුළත් වී නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 13 දින දේශීය ණය සහ සංවර්ධන අරමුදලින් ලබා ගෙන තිබුණු රු.7,000,000 ක ණය ප්‍රාග්ධනය ශේෂ පත්‍රයෙහි ණය ප්‍රාග්ධනය යටතේ ගිණුම් ගත කර නොතිබුණි.

(ඇ) රු.351,850 ක් වූ වරිපනම් හා බදු, අක්කර බදු සහ ජල සේවා ගාස්තු සඳහා අයකරනු ලබන වරෙන්තු ගාස්තු හා දඩ ලැබීම්, ආදායම් හා වියදම් ගිණුමෙහි වරෙන්තු ගාස්තු හා දඩ යටතේ ගිණුම් ගත නොකර අදාල ආදායම් ශීර්ෂයටම බැර කර තිබුණි.

(ඈ) ඉකුත් වර්ෂයේ අංක 4442225 දරන බැංකු ගිණුමෙහි ශේෂය රු.90,000 ක් අඩුවෙන් ගිණුම්ගත වීමේ වරද නිවැරදි කිරීම සඳහා ජර්නල් සටහන් අංක 13 මගින් සමුච්චිත අරමුදල හා ඌනතා ගිණුම බැරකළ යුතු වුවද අවිනිශ්චිත ගිණුම බැර කර තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ රු.29,753 ක් වූ අයකරගත යුතු වැටුප් රහිත නිවාඩු වටිනාකම ණයගැතියන් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයට ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම ලෙස රු.8,239,970 ක් ගිණුම් ගතකළයුතු වුවද ආදායම් හා වියදම් ගිණුමට බැර කර තිබුනේ රු.87,330 ක පමණක් වූයෙන් වෙනස රු.8,152,640 විය.

(උ) සමාලෝචිත වර්ෂයේ රු.157,709 ක් වූ ලැබිය යුතු උසාවි දඩ මුදල ණයගැතියන් ලෙස ගිණුම් ගත කර නොතිබුණි.

1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

--------------------------

මූල්‍ය ප්‍රකාශන අනුව ගිණුම් විෂයයන් 09 කට අදාල ශේෂයන්ගේ එකතුව රු.5,682,201 ක් වූ අතර උපයෝගී ලේඛණ අනුව හා ඉදිරිපත්කරන ලද තොරතුරු අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.5,792,801 ක් වූයෙන් වෙනස රු.110,600 ක් විය.

1.3.3 අවිනිශ්චිත ගිණුම්

-----------------------

සමාලෝචිත වර්ෂය අවසානයට අවිනිශ්චිත ගිණුමේ රු.1,451,785 ක බැර ශේෂයක් විය.

## 1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

2012 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.8,058,539 ක් වූ අතර අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.62,287,229 ක් විය.

## 1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.168,822,637 ක් වූ ශේෂයන් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.3,564,000 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.11,052,444 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම් තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිලිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත<br>රු.000' | තථ්‍ය<br>රු.000' | දෙසැම්බර් 31 දිනට හිඟය<br>රු.000' |
|---|---|---|---|---|
| (i) | වරිපනම් හා බදු | 709 | 358 | 1,092 |
| (ii) | බදු කුලී | 4,280 | 4,725 | 1,428 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,875 | 1,142 | 84 |
| (iv) | වෙනත් ආදායම් | 23,345 | 23,286 | 75,210 |

2.3 අවිධිමත් ගනුදෙනු
---------------------

2.3.1 වාහන කුලී
--------------

රියදුරු දීමනා හා ඉන්ධන දීමනා රහිතව, මිළ ගණන් කැඳවීමකින් තොරව දෛනික කුලී පදනම මත ලබාගෙන තිබු වෑන් රථය සඳහා 2012 නොවැම්බර් මාසයේ දින 16 ක් සේවයේ යෙදවීම වෙනුවෙන් රු.56,000 ක්ද ඉන්ධන වියදම සඳහා රු.18,332 ක් ලෙසට එකතුව රු.74,332 ක් වැයකර තිබුණි.

2.3.2 ගමන් වියදම්
----------------

(අ) ගමන් වියදම් ගෙවීම සඳහා පලකරන ලද රීති පද්ධතියට අනුව සභාව විසින් හෝ මහජන නියෝජිතයෙකු වශයෙන් පැවරී ඇති කාර්යයන් සඳහා පමණක් ගමන් වියදම් දීමනාව ලබාගත යුතු වුවද එලෙස කිසිදු කාර්ය පැවරීමකින් තොරව සමාලෝචිත වර්ෂයේදී රු.315,000 ක මුදලක් ගෙවා තිබුණි.

(ආ) දකුණු පළාත් ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍යවරයාගේ අංක 1413/15 හා 2005 ඔක්තෝබර් 05 දිනැති අතිවිශේෂ ගැසට් නිවේදනයේ 3 (1)(1) රීතියට පටහැනිව සභික දීමනා ගෙවීමේදී අදාල මාසයේ පවත්වන ලද සභා රැස්වීම් සහ කාරක සභා රැස්වීම්වලට සහභාගී වී නොමැති වෛද්‍ය වාර්තා ඉදිරිපත් කර නොමැති මන්ත්‍රීවරුන් 04 දෙනෙකුට රු.30,000 ක මුදලක් සභා අරමුදලින් ගෙවා තිබුණි.

2.3.3 ලිපිද්‍රව්‍ය හා කාර්යාල උපකරණ හා විදුලි උපකරණ මිළදී ගැනීම
-----------------------------------------------------------------------

2012 වර්ෂයේ ලිපිද්‍රව්‍ය හා කාර්යාල උපකරණ මිළදී ගැනීම සඳහා පිළිවෙලින් රු.294,975 ක් සහ රු.781,048 ක් වැය කර තිබු අතර ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 178 පරිදි මිළ ගණන් කැඳවීමක් කර නොතිබුණි.

2.4 කොන්ත්‍රාත් පාලනය
-----------------------

අකුරුගොඩ නිදන්ගල කන්ද පාර කොන්ක්‍රීට් කුට්ටිගල් අතුරා සංවර්ධනය කිරීම සඳහා ගොවි සංවිධානයක් සමග 2012 ජූනි 06 දින රු.967,742 ක් වටිනා ගිවිසුමක් අත්සන් කර 2012 නොවැම්බර් 08 දිනැති අවසන් කළවැඩ වාර්තාව පරිදි රු.963,093 ක ගෙවා තිබුණි.

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ගිවිසුම්ගත වැඩ උපලේඛණයේ විෂය අංක 07 යටතේ සපයන ලද කොන්ක්‍රිට් කුට්ටිගල් සඳහා සහ විෂය අංක 08 යටතේ මාර්ගයේ ගල් ඇතිරීම සඳහා රු.707,080 ක මුදලක් ගෙවා තිබූ අතර, 2013 ඔක්තෝබර් 02 දිනැති භෞතික පරීක්ෂණ අවස්ථාව වන විට එකී කුට්ටිගල් ඇල්ලූ ස්ථාන කිහිපයක් ගිලා බැස තිබුණි.

(ආ) මාර්ගයේ කුට්ටිගල් ඇතිරීමට විෂය අංක 08 යටතේ වර්ගමීටර් 525 ක් ඉටු කිරීමට උපදෙස් පරිදි 1 ½" X2" ක පමණ වැලිතට්ටුවක් අතුරා තැලීම සඳහා රු.142,827 ක මුදලක් ගෙවා තිබුණද මාර්ගය තැනින් තැන ගිලා බැස තිබුණෙන් එකී විෂයයේ වැඩ නියමිත ප්‍රමිතියට ඉටුවී නොමැති බව නිරීක්ෂණය විය.

2.5 මෙහෙයුම් අකාර්යක්ෂමතා

---------------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) වර්ෂ ගණනාවක සිට නිෂ්ක්‍රියව තිබූ ට්‍රැක්ටර් දෙකක් හා යතුරුපැදියක් සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ආ) 1988 අංක 74 දරන පනතින් සංශෝධිත ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 01 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ පනත පරිදි සභාපති ඇතුළු සියළුම මන්ත්‍රීවරු 2012 වර්ෂයේදී වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුල වීදි පහන් හා උපකරණ මිළදී ගැනීම සඳහා රු.584,442 ක් වැය කර තිබූ අතර ලැබීම් හා නිකුත් කිරීම් යාවත්කාලීනව සටහන් කර නොතිබුණි.

(ඈ) 2012 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය අත්තිකාරම් ශේෂවල එකතුව රු.2,254,681 ක් වූ අතර ඉන් රු.67,913 ක් අය නොවන සේවක ණය ලෙස ගිණුම් වල දක්වා තිබුණි.

(ඉ) 2003 ජුනි 02 දින හා අංක පීඒඩී/12 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ 5 ඡේදය ප්‍රකාර සභාවේ දැක්ම හා මෙහෙවර ඉටුකර ගැනීම සඳහා වර්ෂ 03 කට නොඅඩු කාලයක් සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කළයුතු වුවද 2012 වර්ෂය සඳහා එවැනි සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය සඳහා 2006 ජනවාරි 25 දිනැති අංක ජා.ප්‍ර.නි./ප්‍ර.වි.නි./18 දරන චක්‍රලේඛයේ 42 (ආ) ඡේදය ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැස්මක් සභාව විසින් පිළියෙල කර නොතිබුණි.

2.6 අභ්‍යන්තර විගණනය

-----------------------

ආයතනය තුල ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් පවත්වා නොතිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු ද පිහිටුවා නොතිබුණි.

3. පද්ධති හා පාලන

-------------------

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් කළමනාකරණය
(ඇ) ගබඩා පාලනය